00029

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2015

අධ්‍යාපන මනෝවිද්‍යාව – ESU3211

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2015 අප්‍රේල් 01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සිසුන්ගේ චර්යා පිළිබඳ වලංගුවන විශ්වාසදායී නිරීක්ෂණ සිදු කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමා සංවර්ධන ක්‍රියාවලියේ දී ළමයා තුළ 'සූදානම' තීරණය කරන සාධක දෙක (02) කෙටියෙන් විස්තර කරන්න.

03. යම් දෙයක් මතකයට නඟා ගැනීමේදී වැදගත්වන කරුණු තුනක් (03) සුවිශේෂී නිදසුන් ඇසුරින් විස්තර කරන්න.

04. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදී න්‍යායට අනුව පුද්ගල පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

05. තෝන්ඩයික්, පැව්ලොව් හා ස්කිනර් විසින් ඉදිරිපත් කරන ලද න්‍යායයන් චර්යාවාදී න්‍යායයන් ලෙස සලකනු ලැබේ. ශිෂ්‍ය ඉගෙනුම සාර්ථක කර ගැනීම සඳහා යොදා ගතහැකි මෙම න්‍යායන්ට පොදු වූ මූලධර්ම තුනක් (03) කෙටියන් විස්තර කරන්න.

06. 'සංජානනය අවධානය මගින් පහසු කරයි.' සංජානනය හා අවධානය යන පද කෙටියෙන් පැහැදිලි කර ඒ දෙකෙහි සම්බන්ධතාව පැහැදිලි කරන්න.

07. නවයෞවන සිසුන්ගේ ප්‍රජානන හැකියා සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහක් (05) සඳහන් කරන්න.

08. සිසුන්ගේ ප්‍රජානන චර්යා කෙරෙහි චිත්තවේගවල බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

0002

## 2 වන කොටස

09. ගුරුභූමිකාව සාර්ථකව සම්පූර්ණ කිරීමට ගුරුවරයකු තුළ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.

(i) අධ්‍යාපන මනෝවිද්‍යාව හැදෑරීමෙන් ගුරුවරයෙකුට ලැබිය හැකි ප්‍රයෝජන පහත දැක්වෙන අංශ දෙක යටතේ සාකච්ඡා කරන්න.

අ) ගුරුවරයාගේ පුද්ගලික සංවර්ධනය (ලකුණු 06)

ආ) ගුරුවරයාගේ වෘත්තියමය කුසලතා සංවර්ධනය (ලකුණු 06)

( එක් අංශයක් යටතේ උදාහරණ තුන (03) බැගින් දක්වන්න.)

(ii) ළමුන්ගේ වැඩීම හා සංවර්ධනය කෙරෙහි බලපාන ආරය සහ පරිසරය යන සාධක දෙකෙහි අන්තර් රඳා පැවැත්ම සුදුසු නිදසුන් යොදා ගනිමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත් අවධියක් ලෙස නවයෞවන විය සැලකිය හැක.

(i) නවයෞවනයන් තුළ කැපී පෙනෙන සමාජයීය අවශ්‍යතා තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ඉහත දැක්වූ සමාජයීය අවශ්‍යතා සන්තර්පනය කිරීමේ දී සමවයස් කණ්ඩායම්වල දායකත්වය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සන්තර්පනය නොවූ සමාජයීය අවශ්‍යතා නිසා නවයෞවනයන් තුළ පැන නැඟිය හැකි චර්යාමය ගැටලු දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) සුදුසු නිර්වචනයක් යොදාගෙන 'පෙළඹීම' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සුසාධ්‍ය කිරීමට චර්යාවාදී ඉගෙනුම් ප්‍රවේශය අදාළ කරගත හැකි ආකාර හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පෙළඹීම පිළිබඳ ප්‍රජානන ප්‍රවේශයට අනුව බාහිර සාධක මඟින් සිසුන් තුළ ඉගෙනීම සඳහා දිගු කාලීන පෙළඹීමක් ඇති නොවේ. එබැවින් සිසුන් තුළ ස්වයං පෙළඹීම් තත්ත්වයක් ඇති කිරීමට පන්තිකාමරය තුළ ගුරුවරයෙකුට අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 09)

00029

12. (i) ප්‍රජානන ඉගෙනීම් න්‍යායයන්, ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යායවලින් වෙනස් වන්නේ කෙසේදැයි (අ) පෙළඹීම (ආ) සංජානනය හා (ඇ) ඉගෙනීම යන ශීර්ෂ තුන යටතේ සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(ii) බැන්ඩූරාගේ සමාජ ඉගෙනුම් න්‍යායේ මූලධර්ම ප්‍රබෝධක- ප්‍රතිචාර න්‍යායන් හා ප්‍රජානන න්‍යායන් දෙක අතරට ඇතුළත් වේ. මෙම න්‍යායට අනුව ඉගෙනුමෙහි අදියර හතර (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සමාජ ඉගෙනුම් න්‍යායයන් පන්තිකාමර ඉගෙනුමට අදාළ කර ගැනීමේදී ගුරුවරයා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 06)

13. (i) 'ප්‍රජානන සංවර්ධනය' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පියාජේගේ විග්‍රහයට අනුව වියුක්ත චින්තන අවධියෙහි පසුවන දරුවන්ට ගැලපෙන පරිදි ගුරුවරයෙකු විසින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය සැලසුම් කළයුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

(iii) ප්‍රජානන සංවර්ධනය පිළිබඳ පියාජේගේ සහ විගොට්ස්කිගේ න්‍යායන් අතර පවත්නා සමානකම් හා වෙනස්කම් දෙක (02) බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

14. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් (02) සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

අ) ශිෂ්‍යයන්ගේ පෞරුෂ සංවර්ධනය කිරීම සම්බන්ධ ගුරු භූමිකාව

ආ) පියාජේට අනුව 'අනුවර්තනය' සහ 'සංවිධානය' යන ක්‍රියාවලි දෙක සිදුවන අවස්ථාවලදී ඇති වන මානසික ක්‍රියාවලිය

ඇ) ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදී න්‍යාය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට දායක කර ගැනීම.

ඈ) අන්තර්ඥානය ඉගෙනුමෙහි ප්‍රධාන ලක්ෂණ

(ලකුණු 2 x 10 = 20)

- හිමිකම් ඇවිරිණි. -

00029

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**BACHELOR OF EDUCATION (NATURAL SCIENCES)**
**DEGREE PROGRAMME – LEVEL 5**
**FINAL EXAMINATIONS – 2015**
**ESU3211 – EDUCATIONAL PSYCHOLOGY**
**DURATION – THREE (03) HOURS.**

Date: 01st April 2015 Time: 9.30 a.m. 12.30 p.m.

**Answer all questions in Part I & any three (03) questions from Part II.**

## PART I

01. Explain briefly **three (03)** strategies that should be followed to make valid and reliable observations on students' behavior.
02. Explain briefly the **two (02)** factors that determine the 'readiness' of a child during the child development process.
03. Describe **three (03)** factors with specific examples that are important in remembering something.
04. According to the Sigmond Freud's Psychoanalytic theory explain in brief **two (02)** factors that affect personality development of a person.
05. Theories put forwarded by Thorndike, Pavlov and Skinner are considered as behavioural theories. Briefly describe **three (03)** common principles of those theories that can be used to achieve success in student learning.
06. 'Perception is facilitated by the attention' Briefly explain the terms, perception and attention and their interrelationship.
07. State **five (05)** strategies that a teacher could follow to facilitate the development of cognitive abilities in adolescent students.
08. Explain briefly the impact of emotions on cognitive behavior of students.

(5 x 8 = 40 marks)

## PART II

09. In order to complete the teacher's role successfully a teacher should have a good knowledge about educational psychology.

i. Discuss the uses of studying educational psychology for a teacher under the following aspects:

a) Personal development of the teacher. (06 marks)

b) Development of professional skills of the teacher.

(State **three (03)** examples for each section)

(06 marks)

ii. Discuss using suitable examples, the inter dependence of hereditary environmental factors that affect growth and development children.

(08 marks)

10. 'Adolescence' can be considered as an important stage of persons' life.

i. Explain **three (03)** outstanding social needs in adolescents.

(06 marks)

ii. Explain with examples the contribution of peer group in fulfilling the social needs stated above.

(06 marks)

iii. Explain **two (02)** behavioural problems that can be arisen due to unfilled social needs of adolescents.

(08 marks)

11. i. Explain the concept 'motivation' using a suitable definition.

(03 marks)

ii. Explain **four (04)** ways that the Behavioural Learning Approach could be adopted to facilitate the teaching-learning process.

(08 marks)

iii. According to the cognitive learning approach external factors do not generate long term motivation for learning. As such, discuss three (03) strategies that can be followed by a teacher in the classroom to generate self motivation within the students.

(09 marks)

12. i. Discuss the ways in which the cognitive theories of learning differ from the S – R (Stimulus – Response) theories of learning under the topics:
(a) motivation, (b) perception and (c) Learning

(06 marks)

ii. The principles of Bandura's social learning theory fall in between stimulus – Response theories and the cognitive theories.
Explain **four (04)** steps of learning according to this theory.

(08 marks)

iii. Discuss the strategies that should be followed by a teacher in adopting social learning theories in to classroom learning.

(06 marks)

13. i. Explain what is 'cognitive development'

(04 marks)

ii. Discuss in line with Piaget's explanations, how a teacher could plan the teaching-learning process to suit the children in the stage of formal operation.

(10 marks)

iii. Explain the similarities and differences (two each) of the Piaget's and Vygotsky's theories of cognitive development.

(06 marks)

14. Write short notes on any **two (02)** of the topics given below.

    i. The role of the teacher in developing personality of students.

    ii. The mental process that happens according to Piaget during the two processes called adaptation and organization.

    iii. Contributing the Freud's Psychoanalytic theory into the teaching learning process.

    iv. Key features of insightful learning.

(2 x 10 =20 marks)

*-Copyrights reserved-*